ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලටද අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.123,072,884 ක් වූ අතර, ණය පාලන ගිණුමේ ශේෂය රු.123,397,072 ක් වුයෙන් ශේෂ අතර රු.324,188 ක වෙනසක් පැවතුණි.	ශේෂ අතර වෙනසක් පවතින අතර ක්‍රමිකව එම වෙනස සොයා ගනිමින් පවතින බවත්, 2025 වර්ෂයේ මේ සම්බන්ධව සොයා බැලීම සඳහා නව කමිටුවක් පත්කරනු ලබන බව දන්වා තිබුණි.	අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂ වර්ගීකරණ සාරාංශයේ හා පාලන ගිණුමේ ශේෂ අතර පවතින වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතු වන බව.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 04/2018 දරන මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 1.3.1 වගන්තිය ප්‍රකාරව සෑම වාහනයක් සඳහාම වර්ෂ 05 කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්යය වන අතර, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන 42 න් වාහන 11 ක් 2023 වර්ෂයේ රු.58,375,000 කටද, 2024 වර්ෂයේ වාහන 16 ක් රු.136,500,000 කට තක්සේරු කර තිබුණද, එම තක්සේරු වටිනාකම් 2024 මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. දෙපාර්තමේන්තුව සතු වාහන 15 ක් 2024 වර්ෂය සඳහා තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2024 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු වාහන වල වටිනාකම ලෙස රු.35,525,000 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු වලට අනුව, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වාහන වටිනාකම තුළ වාහන 08 ක වටිනාකම ලෙස රු.15,125,000 ක්	දෙපාර්තමේන්තුව සතු වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු විධිමත්ව සිදුවී නොමැති අතර මේ වනවිට තක්සේරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වෙමින් එම කටයුතු ඉටුකරමින් සිටින බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන තුළ දක්වන වාහන වටිනාකම සනාථ කෙරෙන සාක්ෂි තහවුරු කරගත යුතු අතර, අයිතිය පැවරී ඇති සියලු වාහන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

	හඳුනාගෙන තිබුණු අතර, ඒ තුළ රු.2,500,000 ක් වටිනා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා නොතිබුණු ජනාධිපති කාර්යාලයට අයත් කැබ් රථයක්ද ඇතුළත්ව තිබුණි. ඉතිරි රු.20,400,000 ක වටිනාකම සනාථ වන වාහන අංක සහිත වාහන සංඛ්‍යාව, වටිනාකම පිළිබඳ තොරතුරු 2025 සැප්තැම්බර් 26 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව සතු වාහන 42 ම ගිණුම්ගත කර තිබේද යන්න පිළිබඳව විගණනයට සාක්ෂි නොවුණි.		
(ii)	2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය ප්‍රකාරව සෑම වර්ෂ 05 කට වරක් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කළ යුතු බවද, 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතු බවට සඳහන් කර ඇති අතර, දෙපාර්තමේන්තුව සතු ප්‍රාදේශීය කාර්යාල 15 ක හා කලාප කාර්යාල 98 කට අදාළ ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු විධිමත්ව සිදුවී නොමැති අතර මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වෙමින් එම කටයුතු ඉටුකරමින් සිටින බව දන්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.

(ඇ) **අග්‍රිම ශේෂය**

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ACA – 03 ආකෘතියේ 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය ශුන්‍ය ලෙස පෙන්වා ඇති නමුත්, භාණ්ඩාගාර පොත් (SA 70) අනුව ශේෂය රු.223,978 ක් වුයෙන් වෙනස රු.223,978 ක් විය. එම වෙනස ACA – 03 ආකෘතියෙහි ප්‍රේෂණය කරන ලද නමුත්, භාණ්ඩාගාර පොත්වල නොපෙන්වන 2024 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය යටතේද සඳහන් කළ යුතු වුවද, ඒ අනුව සටහන් කර නොතිබුණි.	ලිපිකරු දෝෂයක් බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වන බව.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	කේවල ශේෂ ලේඛනය හා ණය පාලන ගිණුම අතර පවතින මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව.	1.6.1 (අ)

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **වියදම් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්ථන වැය විෂයයන් 04 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.18,000,000 ක් වූ අතර, වියදම රු.9,436,901 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.8,563,099 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 42 සිට සියයට 79 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.	එකඟ වෙමි. මූල්‍ය ප්‍රකාශන ඒ.සී. ඒ. 2 (ii) හි වෙනස්කම්වලට හේතු දක්වා ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.
(ආ)	මූලධන වැය විෂයයන් 03 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.28,000,000 ක් වූ අතර, වියදම රු.12,695,587 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.15,304,413 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 32 සිට සියයට 74 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.	එකඟ වෙමි. මූල්‍ය ප්‍රකාශන ඒ.සී. ඒ. 2 (ii) හි වෙනස්කම්වලට හේතු දක්වා ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.
(ඇ)	207-1-1-0-1508-0/11 වැය විෂයය යටතේ ප්‍රතිපාදිත රු.500,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනය ඉතිරි වී තිබුණි.	207-1-1-0-1508-0/11 - මාරුකිරීම් - මෙම වැය විෂය යටතේ වියදමක් ඇති නොවී ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.

3.2 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවට අයත් තැන්පතු ගිණුම් 07 කට අදාල වසර 02 ඉක්මවූ රු.33,052,742 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023 දෙසැම්බර් 31 වනවිට තැන්පතු කොටසක් රාජ්‍ය ආදායමට බැර කරන ලදි. පැරණි වර්ෂවල ශේෂයන් සම්බන්ධව නිරවුල් කිරීමට 2024 වර්ෂය තුළ කටයුතු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොවූ අතර, 2025 වර්ෂය අවසන් වීමට ප්‍රථම එලෙස තැන්පතු ශේෂ නිරවුල් කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටුවීමේ අරමුණු අතර සමස්ථ පුරාවිද්‍යා උරුමය ආරක්ෂණය කිරීම හා පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම ඇතුළත්ව ඇති නමුත්, 2019 ජනවාරි 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දින දක්වා දිවයින පුරා විසිරී පවතින ශිලා ලේඛන 275 අතුරින් 110 ක් පිටපත් කර කියවා ප්‍රකාශයට පත්කර නොතිබුණු අතර, ශිලා ලේඛන පිටපත් කිරීම සඳහා 2019 සිට 2024 සැප්තැම්බර් 30 දක්වා රු.2,166,780 ක් වැය කර තිබුණි. දිවයින පුරා විසිරී පවතින ශිලා ලේඛන සුවිගත කිරීම කාලීන අවශ්‍යතාවයක් වන අතර, මෙම ලිපි විනාශ වීම වැළැක්වීම සඳහා ශිලා ලේඛන සුවිගත කිරීමේ කාර්යය කඩිනමින් සිදුකළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2019 වර්ෂයේ ජනවාරි මස 01 වනදා සිට 2024 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් සෙල්ලිපි 275 ක් පිටපත් කිරීම සිදුකර ඇත. එම සෙල්ලිපි 275 ක ප්‍රමාණයෙන් සෙල්ලිපි 53 ක ප්‍රමාණයක් මුද්‍රණය කර පළ කර ඇති අතර, ඉතිරි ලිපි 112 ක ප්‍රමාණය ව්‍යාපෘති අවසන් වාර්තාවේ පළ කර ඇත. එසේම ඉහත සඳහන් පිටපත් කරන ලද ශිලා ලේඛනයන්ගේ ඉතිරි ප්‍රමාණය වන සෙල්ලිපි 110 ක ප්‍රමාණයක් 2025 වසරේ කියවා අවසන් කිරීමට නියමිත බව දන්වා තිබුණි.	ශිලා ලේඛන සුවිගත කිරීමේ කාර්යය කඩිනමින් සිදුකළ යුතු වන බව.

4.2 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය තුළදී රු.මි.17 ක් වටිනා ව්‍යාපෘතීන් 33 ක් අනුමත ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත නොකර 2024 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු අතර, 2024 වර්ෂය අවසන් වීමෙන් පසුව එම ව්‍යාපෘතිද සමඟින් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර අනුමැතිය සඳහා 2025 ජනවාරි 15 දින අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2024 සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම 2025 පෙබරවාරි 17 දින අමාත්‍යාංශ ලේකම් අනුමත කර තිබුණි.	එකඟ වෙමි.	ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධනයන් අදාළ අවස්ථාවේදීම සිදු කර නොපමාව අනුමැතීන් ලබාගත යුතු වීම.
(ආ)	2024 පෙබරවාරි 05 දින විගණනය වෙත ඉදිරිපත් කළ 2024 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණු අතර, සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම 2025 පෙබරවාරි 17 දින අනුමත කර තිබුණි. තවද, 2024 සංශෝධනයට පෙර සකස් කළ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීමට නියමිතව තිබූ රු.2,195,000 ක භාණ්ඩ මිලදීගෙන නොතිබුණු අතර, සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.2,421,859 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි. ඒ අනුව ප්රසම්පාදන සැලැස්මට අදාළව සිදුකර තිබුණු වෙනස් කිරීම් සඳහා අදාළ	එකඟ වෙමි.	ප්‍රසම්පාදන සැලැස්මේ සංශෝධනයන් අදාළ අවස්ථාවේදීම අනුමත කරගත යුතුය.

අවස්ථාවේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන මිලදී ගැනීම් සිදුකිරීමෙන් පසුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර අනුමැතිය ලබාගෙන තිබුණි.

4.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතීන් 512 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ නමුත්, ඉන් රු.මි.24.95 ක් වටිනා ව්‍යාපෘතීන් 42 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘතියක් වෙනුවට නව ව්‍යාපෘතියකට අදාළ ප්‍රතිපාදන මාරු කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධන සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.	එකඟ වෙමි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වන අතර, වෙන් කරන ලද ප්‍රතිපාදනයක් නව ව්‍යාපෘතියකට මාරු කිරීමේදී අදාළ අනුමැතීන් ලබාගත යුතුය.
(ආ)	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක SA/MAA/GRG/01 හා 2024 ජූලි 18 දිනැති ලිපියේ 04 ඡේදය ප්‍රකාරව දේශීය ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලිය සඳහා කාර්ය පටිපාටි සංග්‍රහයක් (Procedure Manual) හඳුන්වාදීම අත්‍යාවශ්‍ය බව දක්වා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින දක්වා ඒ සඳහා පියවරගෙන නොතිබුණි.	දේශීය ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වී නොතිබුණු අතර, දේශීය ප්‍රදාන වල අවශ්‍යතාවය සහ ස්වරූපය හඳුනාගෙන, භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරමින් ඒ අනුව මුදලින් ලැබෙන දේශීය ප්‍රදාන විධිමත්ව ගිණුම් තැබීම මේ වන විට සිදුවන අතර, භාණ්ඩ සහ ද්‍රව්‍ය ලැබීම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් මහ භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරමින් පවතින අතර, ගිණුම්ගත කිරීමෙන් අනතුරුව කාර්යපටිපාටි සංග්‍රහයේ	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි දේශීය ප්‍රදාන ගිණුම්ගත කිරීමේ කාර්ය පටිපාටි සංග්‍රහයක් සකස් කළ යුතු වන බව.

		හඳුන්වාදීමට කටයුතු කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි.	
(ඇ)	අධ්‍යක්ෂ වාස්තු විද්‍යා සංරක්ෂණ විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් ඉටුකිරීමෙන් පසුව, පරීක්ෂා කළ දිනට සංරක්ෂණ ව්‍යාපෘතියේ පැවති තත්ත්වය, ඊට අදාළව ලබාදුන් උපදෙස් හා ඉටුකරනු ලැබූ සංරක්ෂණයන් පිළිබඳව විස්තර ඇතුළත්ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතට වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දී ව්‍යාපෘතියේ පැවති තත්ත්වය, ඊට අදාළව ලබාදුන් උපදෙස් හා ඉටු කරනු ලැබූ සංරක්ෂණයන් පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි.	ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබාදුන් උපදෙස් හා ඉටුකරනු ලැබූ සංරක්ෂණයන් පිළිබඳ ඇතුළත් වාර්තාවක් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදිය යුතු වන බවට රාජකාරී ලැයිස්තුවේ ඇතුළත් කළ යුතු වන බව.

4.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2025 මාර්තු 28 දිනැති පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ D.Arch/DG/3-13 (2025) ලිපියෙහි පරමාකන්ද ලෙන් විහාරයේ වහල සංරක්ෂණයෙන් පසුව, වැසි ජලය ලෙන් විහාරයට කාන්දුවන බැවින් එය නිසි පරිදි සංරක්ෂණය කර නොමැති බවත්, වාස්තු විද්‍යා අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ උපදෙස් ලබාදී නොතිබුණු බවත්, නිසි අධීක්ෂණයක් මෙම ඇස්තමේන්තුව සඳහා අංශ ප්‍රධානීන්ගෙන් සිදු වී නොමැති බවත්, පරමාකන්ද ලෙන් විහාරයේ ස්මාරකයට හානි සිදුවී ඇති බවත් සඳහන්ව තිබුණි. වහල සංරක්ෂණය සඳහා රු.2,430,184 ක් වැය කර තිබුණු අතර, නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් මෙම වැය දැරීම අනාර්ථික වී තිබුණි.	2024-09-05/06 දිනයන්හි එම ස්ථානය පරීක්ෂා කිරීමට යාමට නියමිතව තිබූ නමුත් ජනාධිපතිවරණය පිළිබඳ තැපැල් ඡන්දය යෙදී තිබීම හා පුරාවිද්‍යා උපදේශක සභාව පැවැත්වීම නිසා ඒ සඳහා අවස්ථාව අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා)ට නොලැබී ඇත. පරමාකන්ද ලෙන් විහාරයේ වහල සංරක්ෂණයෙන් පසුව වැසි ජලය ලෙන් විහාරයේ කාන්දුව වළක්වා ගැනීමට තහඩුවක් යොදා ඇත්තේ තාවකාලික පිළියමක් වශයෙනි. හිටපු අධ්‍යක්ෂ ජනරාල් විසින් ද මෙම ස්ථානය පරීක්ෂා කර අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා)ට උපදෙස් ලබා දී ඇත. ඉදිරියේ දී මෙම කාර්යය පරීක්ෂා කර බලා ඉටුකරවාලීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු සිදුකළ යුතු වන බව.

4.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ සියයට 50 ට අඩු භෞතික කාර්යසාධනයක් පෙන්නුම් කර ඇති ව්‍යාපෘති 46 ක් පැවති අතර මෙම ව්‍යාපෘති සඳහා රු.මි.61.91 ක් වෙන් කර තිබුණු නමුත්, එම මුදල් වලින් රු.මි.41.79 ක් පමණක් වැය කර තිබුණි. එමෙන්ම රු.මි.31.52 ක් වෙන්කර තිබු ව්‍යාපෘතීන් 22 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	ඒ අනුව ඉතිරිය රු. මි. 117.29 කි. එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් බවට එකඟ වන බව දන්වා තිබුණි.	වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන ඵලදායී ලෙසින් වැය කළ යුතු වන බව.

4.6 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ 10 වන වගන්තිය මඟින් සඳහන් කර ඇති දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ වූ පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම, පුරාවිද්‍යාත්මක උරුමයේ සෑම අංගයක් සම්බන්ධයෙන්ම, විශේෂයෙන් ප්‍රාග් ඓතිහාසික, මූල ඓතිහාසික, පුරාතන ඓතිහාසික, මධ්‍යම ඓතිහාසික හා පශ්චාත් ඓතිහාසික යුග හා සාමාන්‍ය හෝ නිශ්චිත මත ක්‍රම හා අභ්‍යාස සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, පුරාවිද්‍යා උරුමය පිළිබඳව මහජනයා දැනුවත් කිරීම, පුරාවිද්‍යා උරුමය පිළිබඳ ලේඛන සකස් කිරීම, පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳව හානි ඇගයුම් කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාල 15 ට යෙදවිය යුතු වාහන සංඛ්‍යාව කොපමණද යන්න පිළිබඳව ඇගයීමක් කර අවශ්‍යතාවය පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි.	එකඟ වෙමි. දෙපාර්තමේන්තුවේ දැනට පවතින රථ වාහන සංඛ්‍යාව, එම වාහනවල තත්ත්වය හා ස්වභාවය සලකා බලා දෙපාර්තමේන්තුවේ කාර්යය භාරයට අදාළව පවතින අවශ්‍යතාවයන් පාදක කරගනිමින් මෙම දෙපාර්තමේන්තුව සතු විය යුතු වාහන වර්ග හා වාහන සංඛ්‍යාව කොපමණ විය යුතු ද යන්න පිළිබඳ විශේෂ කමිටුවක් වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරන අතර ඒ අනුව ඉදිරියේ දී ඊට අදාළ දෙපාර්තමේන්තු කමිටුව පිහිටුවීමට නියමිතව ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන වාහන සංඛ්‍යාව හඳුනාගත යුතු වන බව.

4.7 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 ඔක්තෝබර් 09 දින සිට 2024 සැප්තැම්බර් 30 දින දක්වා සිදුවූ රිය අනතුරු 11 ට අදාළ අලාභ වටිනාකම රු.6,520,620 ක් වන අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම රිය අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අවසන් වාර්තා ලබාදී නොමැති රථ වාහන අනතුරු වෙනුවෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල පත්කර ඇති අතර, එම මණ්ඩල මඟින් අදාළ වාර්තා ලබාදුන් පසුව ඒ සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව.

4.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.5,031,312 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි ශේෂ වල එකතුව රු.1,413,619 ක් විය. දීර්ඝ කාලීනව පවතින මෙම හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීම සඳහා ලිපියක් මඟින් දැනුම් දී ඇත. සේවය හැර ගිය නිලධාරීන් ගේ හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීම පිළිබඳව දෙපාර්තමේන්තුව තුළ කමිටුවක් පත්කර ඇති අතර තවදුරටත් එම කමිටුව මඟින් අදාළ තොරතුරු සොයා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5, 4.4, 4.5.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 15 තුල ක්‍රියාත්මක වන ඇඟිලි සලකුණු යන්ත්‍ර ප්‍රධාන කාර්යාලයේ දත්ත පද්ධතියකට සම්බන්ධ කර ප්‍රාදේශිය කාර්යාල වල නිලධාරීන්ගේ පැමිණීම ප්‍රධාන කාර්යාලය තුලින් පරීක්ෂා කල හැකිවන ලෙසින් සකස් කර නොතිබුණු අතර ප්‍රාදේශීය කාර්යාල, කලාප කාර්යාල, ප්‍රාදේශීය කෞතුකාගාර හා අනෙකුත් පුරාවිද්‍යාත්මක ස්ථාන	නිලධාරීන් සේවයට වාර්තා කරන වේලාවන් සහ පිටවන වෙලාවන් සහකාර අධ්‍යක්ෂවරුන් විසින් නිරීක්ෂණය කරනු ලැබේ. නව ඇඟිලි සළකුණු යන්ත්‍ර මිල දී ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම නිසා ඇතැම් කලාප කාර්යාල සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර නොමැති බව දන්වා තිබුණි.	පැමිණීම හා පිටවීම නිවැරදිව සටහන් තැබීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වන බව.

	ඇතුලත් ස්ථාන 25 ක් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර යෙදවීමේ අවශ්‍යතාවය ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර තිබුණද ඒ සඳහා කටයුතු කර නොතිබුණි.		
(ඇ)	කලාප කාර්යාල, කෞතුකාගාර, ප්‍රාදේශිය පුරාවිද්‍යා කාර්යාල, පුරාවිද්‍යා ස්ථාන ඇතුලත් ස්ථාන 21 ක අක්‍රියව පවතින ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු අතර ගාල්ල කොටුව විශේෂ කලාපය, හික්කඩුව කලාපය, මාතර තාරකා කොටුව කෞතුකාගාරය යන පුරාවිද්‍යා ස්ථාන වලට අයත් ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියාවට අදාල සේවා ආයතනයට භාරදී අවුරුද්දකට වැඩි කාලයක් ඉකුත්වී පැවති නමුත් ඒවා ක්‍රියාකාරි තත්ත්වයට පත්කරගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය, අම්පාර කාර්යාලය හා ඊට අදාල කලාප කාර්යාල 03ක, බස්නාහිර කාර්යාලය, කෝට්ටේ කෞතුකාගාරය, උඩුගම්පල කලාප කාර්යාලය යන ස්ථාන වල සවිකර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා 2024 වර්ෂයට අදාලව සේවා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරු විසින් අදාළ ප්‍රාදේශීය කාර්යාලවල කලාප නිලධාරීන්ට හා සෙසු නිලධාරීන්ට සේවයට පැමිණීම, පිටවීම හා නිවාඩු ලබාගැනීම සම්බන්ධ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි.	අක්‍රීයව පවතින ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කළ යුතු වන බව හා සේවා ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු වන බව.
(ඈ)	2024 සැප්තැම්බර් මාසයට අදාලව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවිය යුතු රු.110,793 ක හිඟ මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර මෙම හිඟ ශේෂය 2019 වර්ෂයට පෙර සිට පැවත එන බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ ඍජු දුරකථන 04 ක් සඳහා සම්බන්ධතාවයක් ලබා දී ඇතත් එම අංක වෙනුවෙන් දුරකථන සවිකර නොතිබියදී 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.262,258 ක මුදලක් මාසික ස්ථාවර ගාස්තු ලෙසට ගෙවීම කර තිබුණි. ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන ස්ථාවර ගාස්තු අඛණ්ඩව ගෙවීමට කටයුතු කර තිබුණි.	බිල්පත් විධිමත්ව ගෙවීමට අදාළ කටයුතු සිදු කරගෙන යනු ලබන බව දන්වා තිබුණි.	හිඟ බිල්පත් කඩිනමින් නිරවුල් කළ යුතු වන බව හා පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වන බව.

(ඉ)	2023 අගෝස්තු මස හඳුන්වාදුන් ITMIS ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිලධාරීන් තිදෙනෙකුට මුදල් අමාත්‍යාංශය වෙතින් පුහුණුවක් ලබා දී තිබුණද, සෑම මසකම 20 වන දිනෙන් පසුව නොකඩවා අන්තර්ජාලය සමග සම්බන්ධ වී රාජකාරි කල යුතු වුවද දත්ත ප්‍රමාණවත් නොවීම හේතුවෙන් බොහෝ දෙනා එකවර සම්බන්ධවීමට උත්සාහ දැරීමේදි පද්ධතිය බිඳවැටීමේ හා මන්දගාමී වීමේ තත්ත්වය මත දෙපාර්තමේන්තුව තුල ITMIS ක්‍රමය ක්‍රියාත්මක වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.	අදහස් දක්වා නොමැත.	ITMIS ක්‍රමය දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කළ යුතු වන බව.
(ඊ)	පාහියන්ගල පුරාවිද්‍යා ලෙන ගවේෂණය සඳහා නවාතැන් ගැනීම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් නිවාස කුලියට ගැනීමක් පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විමර්ශනයක් 2023 නොවැම්බර් මස සිදු කර ඒ පිළිබඳ නිර්දේශ සහිත රහස්‍ය විමර්ශන වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල් වෙතට යොමුකර තිබුණි. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් මූලික විමර්ශන කමිටුව 2024 ජනවාරි 14 පත් කර තිබු අතර අවස්ථා තුනකදී නැවත කමිටු පත් කර තිබුණි. 2025 පෙබරවාරි 17 දින අවසන් මූලික පරීක්ෂණ මණ්ඩලයක් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබුණද මූලික විමර්ශනයේ කටයුතු අවසන් කර නොතිබුණි.	මේ සම්බන්ධ මූලික විමර්ශන කමිටුව 2024 ජනවාරි 14 දින පත් කර ඇති අතර ඉන් අනතුරුව අවස්ථා තුනකද දී නැවත කමිටු පත් කර ඇත. 2025 පෙබරවාරි 17 දින අවසන් කමිටුව පත්කර ඇති බව දන්වා තිබුණි.	මූලික විමර්ශනයේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වන බව.
(උ)	අනවසර කැණීම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට අදාලව, ගවේෂණ හා ලේඛනගත කිරීමේ අංශයේ කාර්ය පටිපාටි සංග්‍රහයේ 5.1.3 ඡේදය අනුව, පණිවිඩය ලද විගස පළාතේ පුරාවස්තු ආරක්ෂණ පොලිස් කොට්ඨාශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක විය යුතු බවත්, එහි 5.1.4	අනවසර කැණීමක් පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීමට යම් කාල පමාවක් සිදුවන්නේ මෙම කැණීමේ කිසිදු මාර්ග පහසුකමක් නොමැති කැලෑබඳ ප්‍රදේශ වල සිදුකිරීම තුළ පුරාවිද්‍යා නිලධාරීන්ට අදාළ පොලිස් නිලධාරීන් සමඟ ස්ථාන පරීක්ෂා කිරීමට ප්‍රවාහන පහසුකම් නොමැති වීම, දෙපාර්තමේන්තුව තුළ පවතින	අනවසර කැණීම් පිළිබඳ වාර්තාවන් කඩිනමින් ලබා ගැනීමට පියවර ගත යුතු වන බව.

	ඡේදය අනුව, සිද්ධිය වූ ස්ථානය දින 02 ක් තුළ පරීක්ෂා කර ගලේ 19 ආකෘතිය මගින් තොරතුරු වාර්තා කළ යුතු බවත්, ගලේ 19 ආකෘති පත්‍රය දින 03 ක් යාමට මත්තෙන් ප්‍රධාන කාර්යාලයේ ගවේෂණ හා ලේඛනගත කිරීමේ අංශයට යොමු කළ යුතු වන බවටත් සඳහන් කර තිබුණි. ඒ අනුව අදාළ සිදුවීම දින 05 ක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතු වුවත්, සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව අනවසර කැණීම් 08 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු සිදු වී නොතිබුණි.	කැබ් රථ නිතර නිතර ආපදාවන්ට ලක්වීම, අධික රාජකාරී ප්‍රමාණයක් ආවරණය කිරීමට සිදුවීම හා ප්‍රමාණවත් ඉන්ධන නොමැති වීම යන කරුණු මත පදනම්ව බවට දන්වා තිබුණි.	
(ඍ)	තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමේ අරමුණින් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා වූ 2022 ස්ථානීය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 පෙබරවාරි 07 දින මෙම සංවර්ධන සැලැස්ම අනුමත වී තිබුණ ද අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම මත ක්‍රියාත්මක වී නොමැත. 2026 වර්ෂයේදී සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා බෞද්ධාලෝක පදනම විසින් අනුග්‍රාහ දැක්වීමට වාචික එකඟතාවය පළ කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ. එසේම 2025 වර්ෂයේ තෝනිගල සෙල්ලිපිය සඳහා ආවරණ වහලක් සකසා සංචාරකයන් සඳහා විවෘත කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි.	පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක රැක ගැනීමට සැලසුම් සහගතව කටයුතු කළ යුතු බව.
(එ)	පෘතුග්‍රීසීන් විසින් ඉදිකර පසුව ලන්දේසීන් විසින් ප්‍රතිසංස්කරණය කර ඇති බවට මූලාශ්‍ර සාධක පවතින මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ මුක්කරිපුත්තුරය ග්‍රාමයේ පිහිටා ඇති හෙක්ටයාර 0.4465 ක භූමි ප්‍රදේශයක් පුරා විසිරී ඇති අරිප්පු බලකොටුව 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 දරන ගැසට් පත්‍රය මගින් පැරණි / ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති නමුත්, 2024 දෙසැම්බර් 31 දින දක්වාත් පුරාවිද්‍යාත්මක කාර්යයක් සිදුකර නොතිබුණි.	එකඟ වෙමි.	පනත, ගැසට් නිවේදන, අභ්‍යන්තර කාර්ය පරිපාටි හා අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව පුරාවිද්‍යා භූමීන් ආරක්ෂා කළ යුතු බව.

(ඒ)	මන්නාරම් දිස්ත්‍රික්කයේ නානට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුරුංකන් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මුරුංකන් රෝහල් භූමියේ පිහිටා ඇති දිගින් සෙ.මී. 160 ක් හා පළලින් සෙ.මී 61 ක් වූ පුවරු ලිපිය ක්‍රි.ව. 2-3 සියවස් වලට අයත් යැයි සැලකෙන අතර, එහි ගෙවී ගොස් ඇති අපරබ්‍රාහ්මීය අක්ෂර දක්නට ලැබෙන පුවරු ලිපිය 2014 ජූනි 20 දිනැති අංක 1868 දරන ගැසට් පත්‍රය මඟින් පැරණි/ ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නමුත්, රෝහල් සේවකයන් විසින් එය අසුන් ගැනීම සඳහා භාවිතා කිරීම හේතුවෙන් අනාරක්ෂිතව අක්ෂර මැකී ගොස් පැවති බවට නිරීක්ෂණය විය.	ආරක්ෂක වැට ඉදි කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම ලබා දෙන ලෙස 2025 අප්‍රේල් 22 දින පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙතින් ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇති අතර එම ලිපියේ පිටපත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වෛද්‍ය අධිකාරී (මුරුංකන්) වෙත ද යොමු කර ඇත. ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ විසින් විමසා ඇති අතර 2025 මැයි 28 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ද මේ පිළිබඳ සාකච්ඡාවට බඳුන් වී ඇති බවට වාර්තා වී ඇත. ඒ අනුව ආරක්ෂක වැට ඉදි කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීමේ කාර්යය මන්නාරම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පැවරී ඇති බවත් වාර්තා වේ. කෙසේවුවද ඉහත සඳහන් කරන ලද පාර්ශවයන්ගේ එකඟතාවයක් නොමැතිවීම හේතුවෙන් ආරක්ෂක වැට ඉදි කිරීමේ කාර්යය මෙතෙක් සිදුකිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	පනත මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවිද්‍යා ස්මාරක රැක ගැනීමට කටයුතු කළ යුතු බව.
(ඔ)	කන්දරෝඩෙ (කඳුරුගොඩ) පුරාවිද්‍යා ස්ථානයේ කුඩා ස්තූප පවතින පරිශ්‍රයෙහි වැසි වතුර පිරී යාම හේතුවෙන් හායනයට ලක්වන සංරක්ෂිත ස්තූප කොටස් සහිත පරිශ්‍රයේ වැසි වතුර බැස යාමට නළ පද්ධතියක් එළීම සඳහා 2016 වර්ෂයේදී ඉදිරිපත් කළ රු.534,150 ක ඇස්තමේන්තුව මත රු.67,000 ක මුදලක් වැය කරමින් මිලදීගෙන තිබූ හියුම් පයිප්ප නිශ්කාර්යයව පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි.	හියුම් පයිප්ප එළීමේ කාර්යයට ප්‍රාදේශීය ලේකම්ගේ විරෝධතාවය පළවීම හේතුවෙන්, හියුම් පයිප්ප සවි කිරීම ගැටළුකාරී වී ඇත. දෙපාර්තමේන්තුවේ වෙනත් කටයුත්තක් සඳහා මෙම හියුම් පයිප්ප යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ කරුණු සොයා බලමින් පවතින අතර කඩිනමින් මෙම පයිප්ප වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරෙන බව දන්වා තිබුණි.	මිලදී ගත් හියුම් පයිප්ප කඩිනමින් වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඕ)	දීඝවාපී චෛත්‍ය සංරක්ෂණය සඳහා 2013 – 2014 වර්ෂ වලදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලබාගෙන ඇති ඉංජිනේරු ගඩොල් 377,000 ක් නිසි තාක්ෂණික වාර්තා නොමැතිව මිලදී ගෙන පැවති හෙයින් ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පැවැත්වීම හා ඒ පිළිබඳ අවසන් තීන්දුවක් ලබාදී නොමැති වීම හේතුවෙන් වර්ෂ 12 කට අධික කාලයක් තිස්සේ කාලගුණික විපර්යාස වලට භායනය වෙමින් විශාල ගඩොල් අට්ටි කිහිපයකට වෙන් කර චෛත්‍ය වටා ඇති සලපතල මළුව හා වැලි මළුව ආශ්‍රිතව ගොඩ ගසා පැවතුණි.	මේ සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම විසින් නඩු පවරා ඇති නමුත්, මේ වන තෙක් නඩු කටයුතු අවසන් වී නොමැති බව දන්වා තිබුණි.	ගැටළුව විසඳීමට කඩිනමින් අවශ්‍ය පියවරගත යුතු වන බව.
(ක)	උතුරු පළාතේ බොහෝ පුරාවිද්‍යාත්මක ස්ථානයන්හී මූලික ගවේෂණ කටයුතු පමණක් සිදුකර තිබුණු අතර, විස්තීරණ ගවේෂණයක් මඟින් අදාළ ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. මෙලෙස උතුරු පළාතේ හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන 479 කින් 05 ක් සඳහා පමණක් විස්තීරණ ගවේෂණ සිදුකර තිබුණි.	උතුරු පළාතේ ජනවාර්ගික ගැටළු පැවතීම හා පුරාවිද්‍යා ඉඩම් සම්බන්ධ පවතින අර්බුදකාරී තත්ත්වය මත විස්තීර්ණ ගවේෂණ සිදුකිරීමට ක්‍රමවේදයන් සැකසීමට බාධා ඇති විය.විශේෂයෙන් යම් යම් පුරාවිද්‍යා ස්ථාන (කුරුන්දි විහාරය, වෙඩික්කිනාරිමලෙ, ගුරුකන්ද වැනි) ස්ථාන සඳහා අධිකරණයෙන් ලබා දී තිබූ තීරණ නිසා පුරාවිද්‍යා නිලධාරීන්ට ඒ සඳහා අවතීර්ණවීමට අවස්ථාවක් නොවූ අතර මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කර 2026 වර්ෂයේ සිට ඉදිරි වසර තුන (2026 – 2028) තුළ විස්තීර්ණ ගවේෂණ ක්‍රියාත්මක කිරීමට සැලසුමක් සකසා ඇත. එසේම 2026 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන වසර 5ක සංවර්ධන සැලැස්ම තුළ උතුරු නැගෙනහිර විස්තීර්ණ ගවේෂණ සිදුකිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	විස්තීර්ණ ගවේෂණ කටයුතු සිදු කිරීම සඳහා සැලසුම් කර, සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය..

(ග)	2010 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලබාදුන් මූල්‍ය හා තාක්ෂණික සහාය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර ඇති වූ සහයෝගිතා ගිවිසුම ප්‍රකාරව ආරම්භ කළ මූලික ගවේෂණයත් සමඟ 2018 වර්ෂයේදී පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා 2023 ජූලි මාසය වන විට උතුරු පළාතේ හඳුනාගත් 479 ක් වූ සමස්ථ පුරාවිද්‍යා ස්ථානවලින් පුරාවිද්‍යා ස්ථාන 252 ක අයිතිය පවරා ගෙන මායිම් කණු යොදා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට 2025 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	උතුරු නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක සාධක සහිත බොහෝ ඉඩම් පුද්ගලයින් සන්තකව පවතී. එවැනි ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අයිතියක් නොමැති අතර, ඉඩම් ගැටළු නොමැති ස්ථාන පුරාවිද්‍යා රක්ෂිත හා ස්මාරක බවට පත් කිරීමේ දී ස්ථානය පිළිබඳ විධිමත් පූර්ණ වාර්තාවක් සකස් කළ යුතුය. නමුත් උතුරු නැගෙනහිර පළාතේ සිංහල නිලධාරීන් හිඟවීම හේතුවෙන් සිංහල භාෂාවෙන් වාර්තා සකස් කර ගැනීම ප්‍රමාද වීම් සිදුවී තිබෙන බවට දන්වා තිබුණි.	1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවිද්‍යා ස්ථානවල අයිතිය පවරාගෙන මායිම් කණු යොදා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතු වන බව.
(ච)	නාගතාම්බ්‍රාන්, වවුනිකුලම්, සිවපුරම් ශ්‍රීමලේ කෝවිල යන හඳුනාගන්නා ලද පුරාවිද්‍යා නටඹුන් පැවති ස්ථානයන්හි දැනටමත් ස්ථූප ගොඩැලි සම්පූර්ණයෙන්ම පොළොවට සමතලා කොට එම භූමිය තුළ සහ නෙඩුන්කේනි ශිව නගර්, කුලාමුරිප්පු, කොඩ්ඩියාමලෛ යන පුරාවිද්‍යා ස්ථානයන්හි ඇති ස්ථූප ගොඩැලි මත වෙනත් ආගමික ස්ථාන ඉදිකර තිබුණි.	මේ සඳහා වවුනියාව ප්‍රාදේශීය කාර්යාලයෙන් තොරතුරු කැඳවා ඇති අතර පිළිතුරු ලද වහාම විගණනය වෙත යොමු කරන බව දන්වා තිබුණි.	1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවස්තු රැක ගැනීම සිදු කළ යුතු අතර, අවශ්‍ය තැන්හිදී ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ යුතු වන බව.
(ජ)	උතුරු පළාතේ පිහිටි වෙඩික්කිනාරිමලෛ පුරාවිද්‍යා ස්ථානය, නෙළුක්කුලම, කිඹුලාගල නන්දිමිත්‍රගම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඇති ස්මාරක, නෙඩුන්කේනි ශිවනගර් පුරාවිද්‍යා ස්ථානය, සමලන්කුලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සමලන්කුලම පුරාවිද්‍යා ස්ථානය, මාතොට වරාය නගරය සහ 2008 ජූනි 06 දිනැති අංක 1553 දරන ගැසට් පත්‍රය මඟින් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානයද මේ දක්වාම අදාළ මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර	සමලන්කුලම පුරාවිද්‍යා ස්ථානය සඳහා මැනුම් නියෝග නිකුත් කරන ලෙසට 2024 මාර්තු 26 දින වවුනියාව ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් සිදු කර ඇත. මේ සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කර ඇති අතර මෙතෙක් පිළිතුරු ලැබී නැත. එසේම වෙඩික්කිනාරිමලෛ හා තෝනිගල පුරාවිද්‍යා ස්ථාන රක්ෂිතයන් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා වන සංරක්ෂක ජනරාල්ගෙන් එකඟතාවයන් ලබාගැනීමට 2024 පෙබරවාරි 02 දින ඉල්ලීම් සිදු කර ඇත. අවශ්‍ය එකඟතාවයන් ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව සහ නෙළුක්කුලම, කිඹුලාගල නන්දිමිත්‍රගම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඇති	මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම් සිදුකර ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් කාල ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතු වන බව.

	නොතිබුණි.	ස්මාරක, නෙඩුන්කේනි ශිවනගර් පුරාවිද්‍යා ස්ථානය, මාතොට වරාය නගරය සඳහා රක්ෂිත යෝජනා යාපනය ප්‍රාදේශීය කාර්යාලය විසින් ලබා දී තිබෙන අතර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	
(ට)	කුරුදුමලේ (කුරින්දි) පුරාවිද්‍යා ස්ථානයේ නටඹුන් බහුලව විසිරී පැවති අක්කර 229 ක භූමිය මැන මාණක සැලසුම් පිළියෙල කර දෙන ලෙසට 2020 නොවැම්බර් සිට අදාළ රාජ්‍ය ආයතන වෙතින් ඉල්ලීම් කර තිබුණ ද, මෙම කාර්යයන් විගණිත දින දක්වා ඉටුවී නොතිබුණි.	මේ සඳහා 2021 ඔක්තෝබර් 11, 2021 නොවැම්බර් 02, 2022 සැප්තැම්බර් 15 හා 2023 මාර්තු 13 දිනයන්හි දී ලිඛිතව ඉල්ලීම් සිදුකර තිබුණ ද මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් විසින් මේ දක්වා පිළිතුරු එවා නැත. එමෙන්ම 2022 වර්ෂයේ මුලතිව් අධිකරණයෙන් ලබා දී ඇති තීන්දුව නිසා කුරුන්දි විහාරයේ කටයුතු නිරවුල් කර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව මේවනවිට කටයුතු කරමින් තිබේ. ඒ සඳහා කමිටුවක් පත්කර නිර්දේශ සකස් කරමින් පවතින බව දන්වා තිබුණි.	අදාළ රාජ්‍ය ආයතන හා සම්බන්ධ වී මැනුම් කටයුතු සිදු කරගෙන පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කල යුතු වන බව.
(ඩ)	2024 ජූලි 13 දින සිට ජූලි 18 දක්වා පෞද්ගලික විදේශ සංචාරයක නිරතව සිටි වාස්තු විද්‍යා සංරක්ෂණ අධ්‍යක්ෂකට වෙන් කරන ලද නිල රථය 2024 ජූලි 13 දින සිට ජූලි 17 දින දක්වා දීඝවාපි සහ නීලගිරි චෛත්‍යන්හි ධාතු නිධාන උත්සවය වෙනුවෙන් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව කි.මී.1691 ක දුරක් ධාවනය කර තිබුණු අතර, එම දිනයන් සඳහා ධාවන සාරංශයෙහි මාණ්ඩලික නිලධාරියා ලෙස ඉහත විදේශ සංචාරයෙහි නිරත නිලධාරියා විසින් අත්සන් තබා තිබුණි. තවද, පෞද්ගලික විදේශ නිවාඩු ලබා සිටි ඉහත කාලසීමාව තුළ වාහනය දෙපාර්තමේන්තු වාහන සංචිතය වෙතට ලිඛිතව භාරදීද නොතිබුණි.	වාස්තු විද්‍යා සංරක්ෂණ අධ්‍යක්ෂක විදේශගත වීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත්තේ 2024 ජූනි18 දිනවන අතර අනුමැතිය ලැබුණේ 2024 ජූලි 12 දිනය. එම ගමන පිටත් වූ අතරවාරයේ දී ඔහුගේ වාහනය දෙපාර්තමේන්තුවේ වගකීමට යටත් අත්‍යාවශ්‍ය රාජකාරියක් සඳහා වගකිවයුතු නිලධාරීන් දෙදෙනෙකු සමඟ රාජකාරියේ යෙදවීම සිදුකර ඇති බව දන්වා තිබුණු අතර, පෞද්ගලික විදේශ නිවාඩු ලබා සිටින කාලසීමාව තුළදී අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා) නිල වාහනය දෙපාර්තමේන්තු සංචිතය වෙත භාරදිය යුතු බව අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා) මීට පෙර දැනුවත් වී නොමැති බව දන්වා තිබුණි.	විදේශගතවීමකදී නිල වාහනය සංචිතය වෙත භාරදිය යුතු අතර, ගමන් සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 250 ක් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු තත්‍ය සංඛ්‍යාව 274 ක් වූයෙන් 24 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. තවද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 15 ට අදාළව සේවකයින් අනුයුක්ත කිරීමේදී තනතුරු 12 කට අදාළව අනුමත සේවක සංඛ්‍යාව 385 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 498 ක් වූයෙන් අතිරික්ත සංඛ්‍යාව 113 ක්ව පැවතුණි. මේ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට සහ ප්‍රාදේශීයව අනුයුක්ත කිරීම් අනුමත සේවක සංඛ්‍යාව තුළ සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය යටතේ සංවර්ධන නිලධාරී තනතුරු 250 ක් අනුමත වී ඇත. 2025 ජූනි 30 දින වන විට සිටින කාර්ය මණ්ඩලය අනුව සංවර්ධන නිලධාරී තනතුරු දරන නිලධාරීන් 24 ක් අතිරික්ත සේවයේ යේදී සිටින අතර, එම තනතුරු 24 අනුමත කිරීමට අංක ARCH/HO/ADM/1/15/32 (iii) දරන හා 2025 ජූලි 17 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි.	අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමටද, දෙපාර්තමේන්තුවේ අන්තර් කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීම් සම්බන්ධයෙන්ද විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතු වීම.